<u>සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තුමේන්තුව - සති පාසල</u>

**01. ශ්‍රේණිය : 11 විෂයය: ගෘහ ආර්ථික විද්‍යාව සතිය : 15 වන සතිය**

**02. පාඩම හෝ ඒකකය: 13 ළදරුවන් රැක බලා ගැනීම**

**03. මෙම පාඩම තුලින් ලබා ගත හැකි ඉගෙනුම් ඵල:**

- ළදරුවන්ගේ සමස්ත සංවර්ධනය සඳහා අවස්ථා සලසා දීමෙන් ඔවුන්ව රැකබලා ගන්නා ආකාරය පැහැදිලි කරයි.

04. ශිෂ්‍යයා කල යුතු කාර්යයන්:

I. ගෘහ ආර්ථික විද්‍යාව පෙළ පොතේ දහතුන් වන පාඩම හොඳින් කියවා තේරුම් ගන්න.
II. පාඩමේ මුල් කොටස මගින් ඔබ හඳුනා ගත් ළදරුවන්ගේ පළමු වසරේ වර්ධන ස්වාභාවයන්හිදී පිළිඹිමු කරන හැකියා තව දුරටත් වර්ධනය සඳහා රුකුලක් ලෙස අත්දැකීම් ලබා දීමට වැඩිහිටියන් කටයුතු කල ආකාරය පිළිබඳව අවබෝධයක් ලබා ගන්න.
III. මනා පෝෂණයක් ලබා දීම, වයස් වලට අනුව ක්‍රියාකාරකම් සඳහා අවස්ථාව ලබා දීම, ප්‍රතිශක්තිකරණය ලබා දීම, ස්වස්ථතාව ආරක්ෂා කිරීම, හදිසි අනතුරු වලින් වලක්වා ගැනීම යන කරුණු සම්බන්ධයෙන් රැකබලා ගන්නෙකු විසින් අවධාරණය කල යුතු කරුණු ඇතුලත් කෙටි සටහනක් සකස් කරන්න.

05. ඉහත ක්‍රියාකාරකම් සඳහා අවශ්‍ය තොරතුරු තව දුරටත් අධ්‍යයනය කිරීම සඳහා අන්තර්ජාලය හා සම්බන්ධ වන්න.

- https://www.youtube.com/watch?v=GuITA87wtLg
- https://www.youtube.com/watch?v=hQsCTwcrv64

වෙනත් ඉගෙනුම් ආධාරක: තරුණී, රජිණ, සිරිකත, වැනි පුවත්පත් හා සඟරා

06. ඇගයීම / තක්සේරුකරණ ක්‍රමවේදය:

I. මව් කිරි නිපදවීමට අවශ්‍ය හෝමෝනය නම් කරන්න. ලකුණු 05
II. පළමු මව්කිරි ලබා දීමේ වැදගත්කම කරුණු ලෙස ඉදිරිපත් කරන්න. ලකුණු 05
III. මව් කිරි ලබා දීමෙන් මවට සැලසෙන වාසි නම් කරන්න. ලකුණු 10
IV. පහත සඳහන් අවස්ථා වලදී සැලකිලිමත් විය යුතු කරුණු දක්වන්න.
V. a. ළදරුවාට අතිරේක ආහාර ලබා දීම b. ළදරුවාට ආහාර ගැනීම පුරුදු කිරීම ලකුණු 10
VI. උපතේ සිට අවු.15 දක්වා දෙනු ලබන "ජාතික ප්‍රතිශක්තිකරණ වැඩසටහන" ලෙස කාඩ්පතක් නිර්මාණය කරන්න. ලකුණු 20